# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2025
# සිංහල භාෂාව හා සාහිත්‍යය

නම / විභාග අංකය : ........................................................................................................................................

| 09 ශ්‍රේණිය | I සහ II පත්‍රය | කාලය : පැය දෙක යි. |
|---|---|---|

- **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම කොටස සඳහා **ලකුණු 40ක්** ලැබේ.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) වරණවලින් **නිවැරදි** උත්තරය තෝරා යටින් ඉරක් අඳින්න.

- **එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අදහස ප්‍රකාශ වන පිළිතුර තෝරන්න.**

**(01)** "මුහන්දිරම් මාමාගේ <u>**බහින කලාව**</u> ළං වෙලා" යැයි තාත්තා කීවේ ය.

(1) ආදායම සරු බව (2) ආදායම පහත වැටෙන බව

(3) ආදායම් උපයන බව (4) අමතර ආදායම් ලබන බව

**(02)** "ඔය කවුරුත් <u>**එක මල්ලේ ලුණු කාපු**</u> අය" යැයි කියමින් ගුරුතුමා වැරදි කළ සිසුන්ට අවවාද කළේ ය.

(1) හවුලේ වැරදි කළ අය (2) පාසලේ ගෞරවය නැති කළ අය

(3) හවුලේ ලුණු කෑ අය (4) යහපත් දෙයක් කළ අය

- **හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.**

**(03)** භාෂා .................................... වර්ධනය කර ගැනීමට නම් මුලින් ම කළ යුත්තේ සවන් දීම ය.

(1) ශක්‍යතාවන් (2) නිපුණතාවන් (3) ප්‍රබුද්ධතාවන් (4) අවශ්‍යතාවන්

**(04)** විවිධ රටවල කලා .................................... යෙදුණ ද ඔහුගේ නිත්‍ය වාසස්ථානය වූයේ එංගලන්තය යි.

(1) අධීක්ෂණයෙහි (2) නිරීක්ෂණයෙහි (3) ගවේෂණයෙහි (4) පරීක්ෂණයෙහි

- **අංක (05) සහ (06) ප්‍රශ්නවල දැක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු ආඛ්‍යාතය සහිත පිළිතුර තෝරන්න.**

**(05)** සමහරෙක් කලහකාරී ලෙස ....................................

(1) හැසිරෙයි. (2) හැසිරුණේ ය. (3) හැසිරුණා ය. (4) හැසිරෙති.

**(06)** මැඳුරු පෙළ නගරය අලංකාර ....................................

(1) කරති. (2) කරයි. (3) කළෝ ය. (4) කළහ.

**(07)** සියලු ම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) ස්ථූල, විස්මය, පාපිෂ්ට, මර්දනය (2) පරිගණකය, සම්භාව්‍ය, කණිෂ්ඨ, විශිෂ්ට

(3) උශ්ණාධික, ප්‍රස්තාර, ප්‍රතිබද්ධ, නිෂ්ඵල (4) ආශ්චර්ය, කාර්යාලය, ගැහැනිය, අර්ථය

**(08)** අකාරාදි පිළිවෙළට පද පෙළ ගස්වා ඇති වරණය වන්නේ,

(1) සාහිත්‍යය, සිංහල, භූගෝලය, ඉතිහාසය (2) බලය, බෝලය, බින්දුව, බේසම

(3) ඛනිජ, ධර්මය, භවය, වරදාන (4) ණය, නායක, නාදය, නග්න

**(09)** මුලින් දී ඇති පදයට සමානාර්ථ **නොවන** පදයක් සහිත පිළිතුර තෝරන්න.

(1) රන් - කනක, කාංචන, කසුන්, කමල

(2) සතුට - තුට, තොස, ආනන්දය, සොම්නස

(3) ජලය - උදක, අඹ, නී, දිය

(4) ප්‍රසිද්ධ - පසිඳු, පතළ, ප්‍රකට, පරසිඳු

**(10)** දන්තජ අක්ෂර පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) ට, ඨ, ඩ, න (2) ත, ථ, ද, ධ (3) ප, ඵ, බ, භ (4) ක, ඛ, ග, ඝ

**(11)** විරුද්ධාර්ථවත් පද යුගලයක් යෙදී **නොමැති** පිළිතුර තෝරන්න.

(1) කැළැල් - වංක (2) නාමික - නිර්නාමික

(3) ස්වාධීන - පරාධීන (4) බහුශ්‍රැත - අල්පශ්‍රැත

**(12)** මුලින් දී ඇති පදයෙහි බහ්වර්ථ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) නා ☞ නාගයා, තුර්ය, ඇතා, නායක (2) අත ☞ හස්තය, වාරය, පැත්ත, උදව්ව

(3) දද ☞ බමුණා, කොඩිය, කුෂ්ඨය, දැවීම (4) සඳ ☞ උතුම්, චන්ද්‍රයා, කාලය, කාන්තාව

**(13)** පහත සඳහන් වචනයේ අන්තර්ගත පිල්ලම් පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

**පිළිතුරු**

(1) කෙටි ඉස්පිල්ල, ඉස්පිල්ල, පාපිල්ල, ඇදපිල්ල

(2) කෙටි ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල

(3) කෙටි ඉස්පිල්ල, ඉස්පිල්ල, පාපිල්ල, ඇලපිල්ල

(4) ඉස්පිල්ල, ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල, පාපිල්ල

- **අංක 14 සහ 15 ප්‍රශ්නවල ඇති ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

**(14)** (1) තුරු පෙළ සුළඟින් කඩා වැටුණහ. (2) කාන්තාවක අනතුරකට භාජනය වූවා ය.

(3) එක් අයෙක් වීදියේ සැරිසරයි. (4) ගංගාවෝ වේගයෙන් ගලා බසියි.

**(15)** (1) වෛද්‍යවරු රෝගීහු සුවපත් කළහ. (2) නුඹලා සේවයට වාර්තා කළෙහු.

(3) ඔවුහු සියල්ලන් ම රට අතහැර ගියෝ ය. (4) සියොත් කැල නුබ ගැබ අලංකාර කරයි.

**(16)** පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරන්න.

- "බලු මහ මුහුද එම සඳ උතුරෙන් පෙනෙන"
- දැරිය මවගේ දෙපා **වැඳ** පාසල් ගියා ය.
- ගුරුතුමා පාඩම **කියවමින්** පැහැදිලි කළේ ය.
- "සුරවර **සැරදු** විබිසණ දෙව් කැලණි පුර"

(1) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශීර්වාද ක්‍රියා (2) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(3) විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා

**(17)** ආනන්ද කුමාරස්වාමි මහතාගේ ග්‍රන්ථයක් වන්නේ මින් කුමක් ද ?

(1) මඩොල් දූව (2) රන්තැටියක කඳුළු (3) ලක්මිණි පහන (4) මධ්‍යකාලීන සිංහල කලා

**(18)** ධීවර භාෂා ව්‍යවහාරයේ යෙදෙන "ඉයත්තුව" යනු,

(1) වර්ෂාව යි. (2) සාගරයේ රළු බව යි. (3) කාලගුණය යි. (4) නිසසල මුහුද යි.

**(19)** "ගෙයින් ගෙයට ගෙදර බුදුන්
අම්මා යැයි කියනවා
බුදු සමිඳුට වඳින ලෙසින්
දෑත නගා වඳිනවා"

- මෙම කවි පෙළ නිර්මාණය කරන ලද්දේ,

(1) ඩබ්ලියු. ඒ. අබේසිංහ (2) ලක්ෂ්මන් කහටපිටිය

(3) මහගම සේකර (4) ආනන්ද රාජකරුණා

**(20)** කථන ව්‍යවහාරයේ යෙදෙන පහත වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට නිවැරදි පිළිතුර කුමක් ද ?

**"මං කඩේට ගිහිං ආයෙ එනවා"**

(1) මා කඩයට ගොස් යළි එන්නෙමි. (2) මම කඩේට ගොස් ආපහු එන්නෙමි.

(3) මම කඩය වෙත ගොසින් පැමිණෙන්නම්. (4) මම කඩයට ගොස් නැවත පැමිණෙන්නෙමි.

(ලකුණු 02 x 20 = 40යි.)

## II - පත්‍රය

- **(01)** සහ **(02)** ප්‍රශ්න **අනිවාර්ය** වේ. **(03), (04), (05), (06), (07)** යන ප්‍රශ්නවලින් තුනක් තෝරා ගෙන **ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න. මෙම කොටසට නියමිත ලකුණු ගණන **60**කි.

**(01)** ඇගයීමක් ලෙස ඔබ විසින් සකසන ලද **"නිර්මාණ සංග්‍රහය"** ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i) නිර්මාණ සංග්‍රහයට ඔබ විසින් ඇතුළත් කරන ලද නිර්මාණයේ මාතෘකාව කුමක් ද ? (ලකුණු 02යි.)

ii) නිර්මාණ සංග්‍රහය සැකසීමට අවශ්‍ය තොරතුරු සපයා ගත් ක්‍රම **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

iii) ඇගයීම සිදු කිරීමේ දී ගුරුතුමාගෙන් / ගුරුතුමියගෙන් ඔබට ලැබුණු උපදෙස් **දෙකක්** ලියන්න. (ලකුණු 04යි.)

iv) නිර්මාණ සංග්‍රහය සැකසීමේ දී ඔබේ කණ්ඩායමට මතු වූ ගැටලු **දෙකක්** ලියන්න. (ලකුණු 04යි.)

v) ඔබගේ නිර්මාණය මගින් සමාජයට දුන් පණිවුඩය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 02යි.)

vi) නිර්මාණ සංග්‍රහය සැකසීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

(මුළු ලකුණු 16යි.)

**(02)** පහත සඳහන් **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තරවලින් **එකක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් **වචන 200කට නො අඩු** රචනයක් ලියන්න. **සුදුසු මාතෘකාවක් ද යොදන්න.**

(අ) සාහිත්‍යය යනු ජීවිතයට නවමු අත්දැකීම් සම්භාරයක් ලබා දෙන මාධ්‍යයකි. ජනතාවගේ සිතුම් පැතුම් සියුම් ලෙස සාකච්ඡා කෙරෙනුයේ සාහිත්‍යය මගින් ය. සාහිත්‍ය කෘති, උසස් රස වින්දනයට මග පෙන්වයි. මෙවන් හේතු කාරණා සැලකිල්ලට ගනිමින් සාහිත්‍යමය පොත පත පරිශීලනයෙන් යහපත් ප්‍රතිඵල ලබා ගත හැකි ය.

(ආ) සමබර පෞරුෂ වර්ධනයට ක්‍රීඩාව මගින් සිදු වන සේවය ඉතා වැදගත් වෙයි. යහපත් පුරුදු වර්ධනය කර ගැනීමට මෙන් ම අයහපතට තිත තැබීමට ද ක්‍රීඩාවෙන් ලැබෙන පිටිවහල අගය කළ හැකි ය. එසේ ම සෞඛ්‍ය සම්පන්න දිවි පෙවෙතක් උදා කර දෙන ක්‍රීඩාව තුළින් කායික හා මානසික සුවතාවෙන් යුතු සමාජයක් ගොඩනැගෙනු ඇත.

(ඉ) බොහෝ දෙනෙක් මතින් තොර ලෝකයක් පිළිබඳ සිහින මවති. ඒ පිළිබඳ කතා කරති. එහෙත් මේ වන විට මත් රකුසා මුළු ලෝකය ම ගිල ගනිමින් පැවතීම කනගාටුවට කරුණකි. එම නිසා අනාගත ලෝකය භාර ගැනීමට සූදානම් වන තරුණ පරම්පරාව මෙම උවදුරින් බේරා ගැනීමට ශක්තිමත් යාන්ත්‍රණයක අවශ්‍යතාව මතු වී ඇත.

(ඊ) වර්තමාන ලෝකයේ යුදමය ගිනි දැල් වේගයෙන් පැතිරෙයි. එකිනෙකා තම බලය ප්‍රදර්ශනය කිරීමට යාමෙන් සිදු වන විනාශය සුළු පටු නොවේ. මෙමගින් බරපතළ ලෙස අනාගත දරු පරපුරට හානි සිදු වනු ඇත. ඔවුන්ට සුන්දර ලෝකයක් උදා කර දීම වැඩිහිටියන්ගේ යුතුකමකි. එබැවින් යුද ගිනි නිවාලන්නට සැවොම එක්ව කටයුතු කළ යුතු කාලය පැමිණ ඇත.

(ලකුණු 14යි.)

**(03)** ඔබගේ පාසලේ නවීකරණය වෙමින් පවතින පුස්තකාලයට අලුතෙන් පොත් මිල දී ගැනීමට අවශ්‍ය වී ඇති බැවින් ඒ සඳහා සුදුසු පොත් තෝරා ගැනීමට, පොත් නාමාවලියක් ඉල්ලා ගුණසේන පොත් සමාගමට ලිපියක් ලියන්න. ඔබ, පාසලේ සාහිත්‍ය සංගමයේ ලේකම් යැයි සිතන්න.

**නැතහොත්**

ඔබගේ පාසලේ නව පුස්තකාලය විවෘත කිරීමේ උත්සවයට පැමිණෙන මෙන් ආරාධනා කරමින්, ගුරු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(ලකුණු 10යි.)

**(04)** පෙළ පොත ඇසුරෙන් අසා ඇති පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i) 'කුඩා හොරා', 'වෙසක් පහන', 'දුවන රවුළ' යන ළමා සාහිත්‍ය කෘති නිර්මාණය කළේ කවුරුන් ද ?

ii) 'සද්ධර්මරත්නාවලිය' ග්‍රන්ථය රචනා කළේ කවුරුන් ද ? කුමන සාහිත්‍ය යුගයේ ද ?

iii) ස්ටීවන් හෝකින් තම ආචාර්ය උපාධිය සඳහා තෝරා ගනු ලැබූ විෂය ක්ෂේත්‍රය කුමක් ද ?

iv) "දේශීය නර්තනයේ රන් සලකුණ" යන නාමයෙන් අභිමන් ලැබුවේ කවුරුන් ද ?

v) පහත දැක්වෙන කවියේ ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න.

සිය පිරිවර රටතොටට හැම වස්තුව නැති නිම්මා
එද ලොබ හැර ඔබ සමගින් තපසට ආවෙම්මා
.............................................................................
.............................................................................

(ලකුණු 02 × 05 = 10යි.)

**(05)** පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i) පහත සඳහන් පද අර්ථවත් වන සේ වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.

(අ) ඇල -　　　　　　　　(ආ) ඇළ -

ii) පහත සඳහන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.

(අ) ඔවුහු අප සුහදව පිළිගත්හ.　　　　(ආ) ගොවීහු පලතුරු වගා කරති.

iii) මෙම වාක්‍ය නිදොස් කොට ලියන්න.

(අ) කම්කරුවන් නිලධාරීන්ට දොස් නැඟුහ.　　(ආ) අයෙක් සුරා මතින් නැටුවේ ය.

iv) පහත දැක්වෙන වාක්‍යාංශවලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) කිසිවෙකුට දෙවැනි නොවන -　　　　(ආ) අවුරුද්දක් පාසා පැවැත්වෙන -

v) මෙම වාක්‍යයට සුදුසු විරාම ලකුණු යොදා නැවත ලියන්න.

- දැසේ නිල් පැහැය දැවී සෙමෙන් තුරන් විය

(ලකුණු 02 × 05 = 10යි.)

**(06)** පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරෙන් කෙටි පිළිතුරු ලියන්න.

i) "මට ඉතා සන්තෝෂයෙන් අන්තිම ගමන යා හැකි ය."

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද ?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද ?

ii) "දැන් ඔබට **එතුමාගේ** රුව, හඬ හා දස්කම් දැක්වෙන වීඩියෝ පටයක් නැරඹීමට මා අවස්ථාව සලසනවා"

(අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද ?

(ආ) මෙම ප්‍රකාශයේ **එතුමා** යනුවෙන් සඳහන් වන අයගේ එක් ගුරුවරයකු නම් කරන්න.

iii) "මේ උත්තුංග මහා රූපය මට පළමු කොට ඇස ගැසුණේ මිනින්දෝරු ත්‍රිකෝණමිතික ස්ථානයක් පිහිටුවීම සඳහා කඳු මුදුනක් සොයමින් සිටි වේලෙහි ය."

(අ) මෙම ප්‍රකාශය සිදු කර ඇත්තේ කවුරුන් විසින් ද ?

(ආ) ඉහත ප්‍රකාශය උපුටා ගත් ලේඛනය කුමක් ද ?

iv) "එසේ වී නම් මාත් ඒ බොන්ට වුව මැනවැ"

(අ) මෙම ප්‍රකාශය කරනුයේ කා විසින් ද ?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද ?

v) "කඩුගන්නායෙහි පාඨශාලාවේ ශිෂ්‍ය පංක්තියකට සිදත් සඟරාව උගන්වමින් සිටි අපට දිනක් ප්‍රශ්නයෙක් උපන්නේ යැ."

(අ) මෙම ප්‍රකාශය සිදු කර ඇත්තේ කවුරුන් ද ?

(ආ) එතුමන් විසින් ප්‍රබන්ධ කරන ලද ළමා සාහිත්‍ය කෘතියක් නම් කරන්න.　　(ලකුණු 02 × 05 = 10යි.)

**(07)** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

වෘත්තියෙන් කම්හල්කරුවකු වූ පිලිප්පු සිඤ්ඤෝ මෙරට සිටි ප්‍රමුඛ පෙළේ නාඩගම් රචකයෙකි. 'ඇහැලපොළ', 'සුලඹාවතී', 'මාතලන්', 'සිංහවල්ලී' ආදිය ඔහුගේ නිර්මාණ වේ. නීතිඥ ජෝන් ද සිල්වා මහතා ආගමික වූ ද ජාතික වූ ද නාට්‍ය ග්‍රන්ථ නිෂ්පාදනයෙහි පුරෝගාමී වූ කලාවේදියෙකි. මල්වත්තේ, කුසුම් ශාලාවෙහි 'රාමායණය' නම් ඔහුගේ ප්‍රථම නාට්‍යය රඟ දක්වන ලදී. 'නල රාජ චරිතය', 'ශාකුන්තලා', 'සිරිසඟබෝ', 'ශ්‍රී වික්‍රම' යන නාට්‍ය ඔහුගේ අනෙකුත් නිර්මාණ වේ. 'ඔතෙලෝ', 'පද්මාවතී', 'කුස ජාතකය' යන නාට්‍ය චාර්ල්ස් ඩයස් මහතාගේ කෘති වේ. මරදාන 'ටවර්හෝල්' නමැති නාට්‍ය ශාලාවෙහි මෙම නාට්‍ය රඟ දැක්විණි. භාරතීය මහා කලාවේදී මහාකවි තාගෝර්, උදය ශංකර්, රාම් ගෝපාල්, භාරත මුද්‍රා නාට්‍යයේ පුරෝගාමියෝ ය. සිංහල වන්නම් පවා භාරත මුද්‍රා නාට්‍යයේ මුහුණුවර ගත් නිර්මාණ ලෙස සැලකේ.

i) මෙම ඡේදයෙන් කියැවෙන්නේ කුමන ක්ෂේත්‍රයක් ගැන ද ?

ii) මෙම ඡේදයේ දැක්වෙන රංග ශාලා **දෙකක** නම් ලියන්න.

iii) මෙහි සඳහන් ප්‍රකට විදේශීය කලාකරුවන් **දෙදෙනකු** නම් කරන්න.

iv) සිංහල වන්නම් සඳහා ආභාසය ලබා ගත්තේ යැයි සැලකෙන රට කුමක් ද ?

v) මෙහි දැක්වෙන දේශීය නාඩගමක් සහ නාට්‍යයක් සඳහන් කරන්න.　　(ලකුණු 02 × 05 = 10යි.)